**2017 අංක 12 දරන විදේශ විනිමය පනත යටතේ 2018 අංක 02 දරන විධානයන්**

## ආමුඛ ආයෝජන ගිණුම (IIA) සම්බන්ධයෙන් බලයලත් වෙළෙඳුන් වෙත නිකුත් කරනු ලබන විධානයන්

2017 අංක 12 දරන විදේශ විනිමය පනත ප්‍රකාරව 2017 නොවැම්බර් 20 දින නිකුත් කරන ලද 2017 අංක 13 දරන විධානය මගින් දක්වා ඇති නියමයන් හා කොන්දේසිවලට අමතරව, පහත සඳහන් කොන්දේසිවලට යටත්ව විදේශීය ආයතනික ආයෝජකයන් විසින් සිදු කරන ආයෝජනයන් හා සම්බන්ධ ගනුදෙනුවලට පහසුකම් සැලසීමට බලයලත් වෙළෙඳුන්ට මෙමගින් අවසර ප්‍රදානය කරනු ලැබේ.

(i) විදේශීය ආයතනික ආයෝජකයෙකුගේ IIA ගිණුමකට ලැබෙන අරමුදල් අනේවාසික අතරමැදියෙකු ශ්‍රී ලංකාවේ පවත්වාගෙන යන ගිණුමක් මාර්ගයෙන් ලබා ගැනීමට පහත පරිදි අවසර ලබා දී ඇත.

(අ) අනේවාසික අතරමැදියා, ශ්‍රී ලංකාවෙන් පිටත ස්ථාපනය කරන ලද බැංකුවක් වන අවස්ථාවකදී හෝ ශ්‍රී ලංකාවෙන් පිටත පිහිටුවන ලද එවැනි බැංකුවක ශාඛාවක් වන අවස්ථාවකදී ඉහත සඳහන් කළ ගිණුම, වොස්ට්‍රෝ ගිණුමක් (Vostro) හෝ IIA ගිණුමක් විය යුතුය.

(ආ) වෙනත් කිසියම් අනේවාසික අතරමැදියෙකු වන අවස්ථාවකදී ඉහත සඳහන් කළ ගිණුම IIA ගිණුමක් විය යුතුය.

(ii) ඉහත i ඡේදය යටතේ ලද මුදල්වලින් සිදු කරන ලද ආයෝජන විකිණීමෙන් හෝ කල් පිරීමෙන් ලද මුදල් සහ ප්‍රතිලාභ, ආයෝජනය සිදු කළ ආකාරයෙන්ම වොස්ට්‍රෝ ගිණුම හෝ IIA ගිණුම හරහා ආපසු රැගෙන යා හැකිය.

(iii) අනේවාසික අතරමැදියාගේ වොස්ට්‍රෝ ගිණුම හෝ IIA ගිණුමකට මුදල් ලබාදීම උදෙසා බලයලත් වෙළෙන්දෙක් විසින් අනේවාසික අතරමැදියෙකුට කිසියම් වූ ආකාරයකට ණය දීමක් නොකළ යුතුය.

(iv) ඉහත සඳහන් කළ ආයෝජනයන් හා සම්බන්ධ සියලුම ගනුදෙනු වොස්ට්‍රෝ ගිණුමක් හෝ IIA ගිණුමක් හරහා සිදුවූයේ නම්, 2017 අංක 13 කරන විධානයේ 6 වැනි ඡේදයේ දක්වා ඇති ආකාරයට විදේශ විනිමය දෙපාර්තමේන්තුව වෙත වාර්තා කළ යුතුය.

(v) අවසරලත් ගනුදෙනු හා සම්බන්ධව පැන නැගිය හැකි ගනුදෙනු පියවීම් සම්බන්ධ අවදානම් සහ ගනුදෙනුවට සම්බන්ධ අනෙක් පාර්ශ්වයේ අවදානම් වැනි ඕනෑම අවදානමක් අවම කර ගැනීමට බලයලත් වෙළෙඳුන් විසින් අවස්ථානුකූල ක්‍රියාමාර්ගයන් ගත යුතුය.

අධ්‍යක්ෂ
විදේශ විනිමය දෙපාර්තමේන්තුව
2018 දෙසැම්බර් 21